# කුමන කාරණයක් නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ 'බුද්ධ' නම්වන සේක්ද?
## ශ්‍රී ලංකාරාමය - 25.01.2020

පින්වත්නි, අපි මේ අවුරුද්ද ආරම්භ කරනකොට බුදුරජාණන් වහන්සේගේ ගුණ හිතාගෙන ගුණ මෙනෙහි කරගෙන මේ වැඩ සටහන ආරම්භ කරන එක හොඳයි. අපි ගොඩක් ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ ගුණ මෙනෙහි කරන්න ඕනෑ. ඒකට හේතුවක් තිබෙනවා. නැත්නම් මාර පාක්ෂික ධර්ම වලට අහුවෙන්න තිබෙන ඉඩ කඩ හරියට වැඩි වෙනවා. බුදුරජාණන්වහන්සේගේ ගුණ හිතන්නේ මෙනෙහි කරන්නේ නැතුව බුදුගුණ භාවනාවක් කරන්නේ නැතුව චිත්තප්‍රසාදය හදාගෙන ආරක්ෂාවක් ඇතිකර ගන්නේ නැතුව පිරිත් ටිකක් කියවා ගන්නේ නැතුව සමාන්‍යයෙන් bare විදියටම භාවනාවක් කරන්න ගියහම එක්තරා අවස්ථාවක් වෙනකම් පොඩි චිත්ත සමාධියක් වගේ දෙයක් හැදෙනවා. එතැනින් එහාට යම් යම් අවස්ථාවලදී බොහෝ අයට මාර පාක්ෂික ග්‍රහණ සිද්ධ වෙනවා. මේ පින්වතුන් දැකලා ඇති විශේෂයෙන්ම හොඳට භාවනා කරගෙන හොඳට කටයුතු කරගෙන ගිය අය වෙන වෙන දිහාවල් වල යනහැටියක් තිබෙනවා. ඒ අනාරක්ෂිත ස්වභාවය නිසා. බුදුරජාණන්වහන්සේගේ ගුණ මෙනෙහි කරන්නේ නැතුව බුදුගුණ භාවනාවක් කරන්නේ නැතුව බුද්ධානුස්සතියක් වඩන්නේ නැතුව ඒ ගිය ගමන් වල ස්වභාවයක් ඒක. ඕක සමහර විට හාමුදුරුවරුන්ටත් වෙන්න පුළුවන්. ඒක නිසා අපේ පින්වත් පිරිස නිවන් ගමනක යෙදෙන පිරිසක් හැටියට ඒවාගේම යහපත් ආර්ය අෂ්ඨාංගික මාර්ග ධර්ම ප්‍රතිපදාවේ යෙදෙන පිරිසක් හැටියට වහ වහාම නිවනට පත්වෙන්න උත්සාහ දරන පිරිසක් හැටියට අපිට ධර්මය දේශනාකොට වදාළ තථාගතයන් වහන්සේගේ ගුණ හොඳට මෙනෙහි කරන්න ඕනෑ. ඒක බුදුගුණ භාවනාවක් හැටියට වඩන්න ඕනෑ.

අනිත් එක තමයි බුදුරජාණන්වහන්සේගේ ගුණ මනසිකාරය සිද්ධ කරනකොට යහපත් සිත් ඇත්තා වූ දෙව් දේවතාවෝ යහපත් සිත් ඇත්තා වූ බ්‍රහ්මරාජවරු උදව් උපකාර කරනවා. නමුත් ඒ දෙව් දේවතාවන්ගෙන් උදව් ලබාගන්න අපේක්ෂාවෙන් බ්‍රහ්මයන්ගෙන් උදව් ලබාගන්න අපේක්‍ෂාවෙන් නොවෙයි බුදුගුණ වඩන්න ඕනෑ වෙන්නේ. අපේ ශ්‍රද්ධාව ජනිතකරගෙන ශ්‍රද්ධාව ආරක්ෂා කරගන්නයි. තවත් අතිරේක ප්‍රතිඵලයක් තමයි යම් යම් අවස්ථාවලදී යහපත් දෙව් දේවතාවෝ ඇවිල්ලා උදව් උපකාර කිරීම. ඒකනිසා කියනවා **ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී** = ධර්මයේ හැසිරෙන්නා ධර්මයෙන්ම ආරක්ෂා වෙනවා, ධර්මයෙන්ම රැකෙනවා කියලා. අපිට ධර්මයෙන්ම රකෙන්නා වූ ගුණයක් ධර්මයෙන්ම රැකෙන්නා වූ ශක්තියක් අපේ ගාව තිබෙන්න ඕනෑ. ඒක නිසා බුදුගුණ භාවනාව හරි වටිනවා. බුදුගුණ භාවනාව වඩනකොට වඩන විදියකුත් තිබෙනවා. මේ කථාව මේ විදියට කියන්න හේතුව අපි දැන් ඉන්නේ 2020 ජනවාරි මාසයේ. මේ අවුරුද්දේ මේ භාවනා වැඩ සටහනට සම්බන්ධ වෙලා කටයුතු කරන පිංවතුන් සැම දෙනාම පහුගිය අවුරුදුවලට වඩා වැඩියෙන් තව ටිකක් ඉස්සරහට යන්න උත්සාහ කරන්න ඕනෑ, ධර්ම දැනුමෙන් භාවනාවෙන් කැපවීමෙන් ගොඩක් ඉස්සරහට යන්න අධිෂ්ඨානයක් තබා ගන්න ඕනෑ.

ගිය අවුරුද්දේ ජනවාරි මාසයෙන් ආරම්භ කරලා යම්තරම් දුරකට කටයුතු කරගෙන ආවා. දැන් අපිට නාම රූප ධර්ම හඳුනා ගැනීම, ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කිරීම, ඒ ධර්ම අපි හසුකරගන්නේ කොහොමද කියලා තේරුම් ගැනීම, හැම එකක්ම පැහැදිලි වෙනවා ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ගුණ සජ්ඣායනා කරහම, ගුණ මෙනෙහි කරහම, බුදුගුණ භාවනා වැඩුවහම.

බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියන්නේ කුමක් නිසාද කියලා මේ විදියට කියලා තිබෙනවා. අපි අද එතැනින් පටන් ගනිමු. අද මේ පින්වතුන්ට විශේෂ කාරණයක් මේ කියලා දෙන්න යන්නේ - ලොව්තුරා තථාගතයන් වහන්සේට **බුද්ධ** කියන වචනය පාවිච්චි කරන්නේ කුමක් නිසාද කියලා, කියලා දෙන්න යන්නේ. කවුරුවත් කියන ඒවා නොවෙයි අපි බුදුරජාණන්වහන්සේගේ දේශනාව

ආශ්‍රයෙන් දැන ගනිමු ඇයි තථාගතයන් වහන්සේට **බුද්ධ** කියලා කියන්නේ කියලා, ඒක අපි දැන ගත යුතුයි.

**"බුද්ධොති කෙනට්ඨෙන බුද්ධො?** = ලොව්තුරා බුදුරජාණන් වහන්සේට මොන කාරණයක් නිසාද **බුද්ධ** කියලා කියන්නේ?

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්න කිට්ටුව උන්වහන්සේ දේශනා කළා "මහණෙනි මම ඔබලාට දේශනා කරන ලද ධර්මයයි පනවන ලද විනයයි දෙක මාගේ ඇවෑමෙන් පසු ඔබලාට බුද්ධ කෘත්‍යය සිදු කරනවා" කියලා. බුදුරජාණන්වහන්සේ කායිකව වැඩ සිටියත් උන්වහන්සේ කරන්නේ ධර්මය දේශනා කරන එක. උන්වහන්සේ දේශනා කරපු දේවලුත් දේශනා කරනවා, අළුතෙනුත් දේශනා කරනවා. ඒ බුදුරජාණන්වහන්සේ දේශනා කළ ධර්මය උන්වහන්සේ පිරිනිවන් පෑවාට පස්සේ ලෝකයාට පිහිට වෙලා තිබෙනවා. ඒක නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "තථාගතයන් වහන්සේ නෑ කියලා කණගාටුවෙන්න දෙයක් නෑ. මම විසින් දේශනා කළ ධර්මය ඔබලාට ශාස්තෘ කෘත්‍ය සිද්ධ කරනවා" කියලා. අන්න ඒක නිසා අපි වෙන වෙන පැතිවල නොවෙයි යන්න ඕනෑ වෙන්නේ, වෙන වෙන පැතිවල නොවෙයි ධර්මය හොයන්න ඕනෑ වෙන්නේ. ප්‍රායෝගිකව සිහිය නුවණ විහිදුවලා ස්කන්ධ ආදී ධර්මයන් දැකීම කරන්න ඕනෑ අපි තුලමයි. ඒක ප්‍රායෝගිකයි. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ධර්ම කොට්ඨාසයක් තිබෙනවා. ඒ දේශනා කරනලද ධර්ම කොට්ඨාසය සූතමය වශයන් අනිත් ස්වාමීන් වහන්සේලා පරම්පාවෙන් පරම්පරාවට ආරක්ෂා කරගෙන ආව ටිකයි අපි දැනගන්න ඕනෑ. ඒ අනුසාරයෙන් තමයි අපි බලන්නේ අපේ ජීවිතිය දිහා. නැතුව අපිම හොයා ගත්ත බණ ටිකක් අපේ අස්සේ නෑ. අපි අපේ ජීවිතය හිසේ පටන් පාදාන්තය දක්වාම සිත කය වචනය කියන හැම දෙයක්ම බලන්නේ අර දේශනා කරන ලද ධර්මයට අනුකූලවයි. ඒක නිසා ශාසතෘන්වහන්සේ ලෙස මග පෙන්වන, අපේ ජීවිතිය දෙස බලන විදිය ඒ දේශනාවේ තිබෙනවා. ඒක නිසා ඒ තමයි තථාගතයන් වහන්සේ. ඒක නිසා ප්‍රතිපදාවට වැටෙන්න අපි යනවානම් අපි කරන්න ඕනෑ වෙන්නේ මහා කාශ්‍යප මහා රහතන්වහන්සේ සැරියුත් මුගලන් ස්වාමීන් වහන්සේලාගේ පරම්පරාවේ ගෝල බාලයෝ ආනන්ද ස්වාමීන් වහන්සේගේ පරම්පාවෙන් ආපු ගෝල බාලයෝ ඇතුළු ඒ සියලුම දෙනා වහන්සේම ආරක්ෂා කරගෙන රැකගෙන ආපු මේ ප්‍රායෝගික ධර්මය මේ උතුම් ධර්මය අපිට නිවන් පිණිස පවතින ධර්මයේ තමයි ශාසතෘන් වහන්සේ ඉන්නවා කියන්නේ. ඒක නිසා එතැනයි බලන්න ඕනෑ වෙන්නේ. ඒක නිසා ඔය හන්දියක් හන්දියක් ගානේ කඩපිලක් ගානේ ඇහෙන පද කැලි ටිකක් අල්ලාගෙන නොවෙයි අපි ධර්මය හොයන්න ඕනෑ. ඒක නිසා අපි ඍජු වෙන්න ඕනෑ. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා "කවුරුහරි කෙනෙක් කොහේ හරි ප්‍රකාශනයක් කළොත් එහෙම මහණෙනි, ඒක අයින් කරන්නත් එපා බාර ගන්නත් එපා. ඒක තථාගතයන් වහන්සේගේ දේශිත ධර්මයට අනුව ගලපලා බලන්න, ගලපලා බලලා ගැලපෙන්නේ නැත්නම් ඒක උන්වහන්සේගේ දේශනාවක් නොවෙයි කියලා උපේක්ෂාවෙන් අහක් කරලා දාන්න" කියල කියනවා. ඒකයි කරන්න තිබෙන්නේ. මෙතැන ප්‍රශ්නයක් අහනවා,

මේ තමයි ප්‍රශ්නය - **කෙනට්ඨෙන බුද්ධො?** කුමන අර්ථයන් නිසාද **බුද්ධ** කියලා කියන්නේ?

1) **බුජ්ඣිතා සච්චානීති බුද්ධො** = චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගත්ත නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

2) **බොධෙතා පජායාති බුද්ධො** = ඒ තමන් වහන්සේ අවබෝධ කරගත්ත චතුරාර්ය සත්‍ය ධර්මයන් අනිත් අයට දේශනා මාර්ගයෙන් අවබෝධ කර වූ නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

3) **සබ්බඤ්ඤුතාය බුද්ධො** = බුදුරජාණන් වහන්සේ අතීතය අනාගතය වර්තමානය කියන්නා වූ කාලත්‍රයට සම්බන්ධ සියලුම ධර්මයන් දකින - මෙනෙහි කරන මාත්‍රයෙන් පෙනෙන - සියල්ල දකින්නා වූ නුවණ හෙවත් සර්වඥතාඥානය ලබා ගත් හෙයින් ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

4) **සබ්බදස්සාවිතාය බුද්ධො** = සියලුම දේවල් දකින බැවින් ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

5) **අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො** = ලොව්තුරා බුදුරජාණන්වහන්සේට ධර්මය තේරුම් ගන්න කවුරුත් උදව්කරන්න අවශ්‍ය නැති බැවින් **බුද්ධ** කියලා කියනවා.

සමහර අවස්ථා වල මෙහෙම තිබෙනවා. මේකත් කියන්න ඕනෑ. එක අවස්ථාවකදී බුදුරජාණන් වහන්සේ බුදුවෙලා සති කීපයක් යනකොට කාටද මේ ගාම්භීර වූ ධර්මය දේශනා කරන්නේ කියලා බුදුරජාණන්වහන්සේ හොයලා බලනවා. එතකොට කල්පනා වෙනවා ආලාර කාලම - උද්දකරාම පුත්ත කියන්නා වූ දෙන්නා තමයි මේකට ගැලපෙන්නේ කියලා. මේ ධර්මය තෙරුම් ගන්න සුදුසු ගාම්භීර සවභාවයක සියුම් හිතක් තිබෙන්නේ ඒ දෙන්නටයි කියලා ඒ දෙන්නා තෝරා ගන්නවා. ආලාර කලාම ගැන හිතනකොට ඒ වෙලාවේදීම දෙවිකෙනෙක් ඇවිල්ලා කියනවා 'ස්වාමීනී ආලාර කාලාම ගිය සතියේ මිය පරලොව ගියා, ආලාර කාලාම නැතිවෙලා දැන් සතියක් වෙනවා' කියලා. ඒවෙලාවේ 'අලාර කාලමට ඉතාමත් වටිනා අවස්ථාවක් මග හැරී ගියා' කියලා උන්වහන්සේට කල්පනා වෙනවා. ඊට පස්සේ හිතනවා උද්දකරාම පුත්ත ගැන. එතකොට දෙවි කෙනෙක් ඇවිල්ලා කියනවා 'ස්වාමීනි එයත් අන්තරා උනා' කියලා. එතකොට බුදුරජාණන් වහන්සේට මේක කිව්වේ දෙවිවරු. නමුත් උන්වහන්සේ ඒ දෙවිවරු කියපු එක පමණක්ම පිළිගත්තේ නෑ. උන්වහන්සේත් බැලුවා ඒ කියන කථාව කොහොමද කියලා. පස්සේ කාලයදී බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරනවා "දෙවි වරුත් මට ඇවිල්ලා කිව්වා, මමත් නුවණ විහිදුවලා බලන කොට දැනගත්තා ඊට සතියකට කලින් අලාර කාලාමත් ඊට දවසට කලින් උද්දකරාම පුත්ත කියන දෙන්නාම අභාවප්‍රාප්ත වෙලා" කියලා. ඒ අවස්ථා දෙකේදීම උන්වහසේට හිතුනා ඒ දෙදෙනාටම හරිම වාසනාවන්ත භාග්‍යවන්ත අවස්ථාවක් මග හැරී ගියා නේද කියලා.

අනිත් එක තමයි අපි හිතන්න ඕනෑ සමහර අවස්ථාවලදී දෙවිවරු යම් යම් දේවල් කියනවා. එහෙම කිව්වාට ඒ දෙවිවරුන්ගේම වචනය පිළිඅරගෙන ඒකම බාර අරගෙන ඒ අනුසාරයෙන්ම උන්වහන්සේ කාරණා කියන්නේ නෑ. බුදුරජාණන් වහන්සේත් නුවණින් බලනවා, බලලා තමයි උන්වහන්සේ ප්‍රකාශ කරන්නේ. ඒක නිසා **සබ්බදස්සාවිතාය බුද්ධො** කියලා කියන්නේ සියලුම දේවල් උන්වහන්සේට පේනවා. අනිත් එක තමයි **අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො** කියලා කියන්නේ බුදුරජාණන්වහන්සේට කාරණයක් තේරුම් ගැනීමට වටහා ගැනීමට වෙන කෙනෙකුගේ දේශනාවක් වෙන කෙනෙකුගේ මග පෙන්වීමක් අවශ්‍ය කරන්නේ නෑ.

6) **විසවිතාය බුද්ධො** = නොයෙක් ආකාරයේ ගුණ ස්වභාවයන් පැතිරෙන නිසා පුපුලව තිබෙන නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

7) **ඛීණාසවසඞ්ඛාතෙන බුද්ධො** = සියලුම ක්ලේශ ධර්මයන්, ආශ්‍රව ධර්මයන් ක්ෂය කරපු කෙනෙක් නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

8) **නිරුපලෙපසඞ්ඛාතෙන බුද්ධො** = උන්වහන්සේගේ සිත ඇලෙන ගතියෙන් යුක්ත නොවෙන නිසා බුද්ධයි. බුදුරජාණන්වහන්සේගේ සිත ගිය ගිය තැන, බැලූ බැලූ දේ ගැන, ඇසූ ඇසූ දේ ඇලෙන්නේ නෑ. ලේප කියලා කියන්නේ ඇලෙන ගතිය (sticky) මේ ඇලෙන ගතිය තිබෙන්නේ තණ්හාව කියන ධර්මයේ. තණ්හාව නම් වූ ඒ ඇලෙන ගතිය උන්වහන්සේගේ සිතේ නැති නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

9) **එකන්තවීතරාගොති බුද්ධො** = ඒකාන්තයෙන්ම ලොව්තුරා බුදුරජාණන්වහන්සේ වීතරාගී බැවින් බුද්ධ නම් වෙනවා. සිතන දේවල් පිළිබඳ ඇලීමක් බැඳීමක්, හිතන දේවල් වින්දනය කිරීමක් උන්වහන්සේට නෑ. කථාවක් කළාට පස්සේ ඒ කථාව වින්දනය කිරීමේ ගතියක් උන්වහන්සේට නෑ. මොකක් හරි ගමනක් ගියාට පස්සේ විහිළු තහළු කරලා වින්දනය කරන ගතිය උන්වහන්සේට නෑ. කරන දේවල් බලන දේවල් අහන දේවල් හිතන දේවල් පිළිබඳව උන්වහන්සේ වින්දනය කර කර අහන්නේ නෑ, වින්දනය කර කර බලන්නේ නෑ, වින්දනය කර කර අහාර ගන්නේ නෑ. වින්දනය කරනවා කියන්නේ රාගය. එහෙම ගතියක් උන්වහන්සේට නෑ. ඒකාන්තයෙන්ම විතරාගී ස්වභාවය නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

10) **එකන්තවීතදොසොති බුද්ධො** = ඒකාන්තයෙන්ම දකින දේවල් පිළිබඳ ගැටීමක් පීඩා විඳීමක් ද්වේශයක් මුකුත්ම නැති නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

11) **එකන්තවීතමොහොති බුද්ධො** - කිසිම දවසක බුදුරජාණන් වහන්සේ කිසිම ආරම්මණයක මුලාවකට පත්වෙන්නේ නෑ. ඒ නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

මේ වචන එහෙට මෙහෙට කඩන්න හොඳ නෑ. එහෙම කඩලා එක කෑල්ලකට එක අර්ථයක් තව කෑල්ලකට තව අර්ථයක් දාන්න හොඳ නෑ. වීතමෝහ කියන ඒකෙ 'වී' කියන එක කඩලා 'තමෝ' කියලා කඩන්න හොඳ නෑ. 'වී' කියලා කියන්නේ හාල් කියලා එහෙම කඩන්න හොඳ නෑ. ඒකෙන් වෙන්නේ ධර්මය විකෘති වීමයි. ධර්මය විකෘති කිරීමෙන්, ධර්මය විකෘති වෙලා එන අදහස් වලින් අපි අයින් වෙන්න ඕනෑ. ධර්මය විකෘති කරනවා කියලා කියන්නේ අපි පොට වරද්දා ගන්නවා කියන එකයි.

12) **එකන්තනික්කිලෙසොති බුද්ධො** = ඒකාන්තයෙන්ම බුදුරජාණන්වහන්සේ කෙලෙස් නැති කෙනෙක්. ඒ නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

තථාගතයන් වහ්සේගේ ධර්මය ආර්යන් වහන්සේලා බොහෝම පරෙස්සමෙන් ඒවා එහෙට මෙහෙට කරන්නේ නැතුව ධර්මය විකෘති කරන්නේ නැතුව මේ ධර්මය ලෝකයාට සසර දුකෙන් මිදී යෑම සඳහා ධර්ම ඖෂධයක් හැටියට, ධර්ම ඉනිමගක් හැටියට, ධර්ම සේතුවක් හැටියට තමයි මේක දේශනා කරලා තිබෙන්නේ. ඒක වෙන වෙන කෑලි වලට කැඩුවොත් එහෙම ඒකෙ තිබෙන ශක්තිය නැති කරලා දුර්වල කරලා අපායගාමී වෙන තත්වයට පත්වෙනවා.

මොකක්ද සිංහලෙන් කාර්ය කියලා කියන්නේ? කාර්ය කියලා කියන්නේ වැඩක්. රජයේ වැඩට අපි කියනවා රාජකාරිය කියලා. දෙවියන්ට කරන සේවයට දේවකාරිය කියලා කියනවා. (කාරිය = කටයුත්ත = ක්‍රියාව). දැන් කවුරුහරි කෙනෙක් මේ රජකාරිය - දේවකාරිය කියන ක්‍රියාවල් මග හරිනවා, නවත්වනවා කියන අර්ථය ගන්න 'කාරියවසම්' කියන වචනය කඩලා (කාරිය + වසම්) = (ක්‍රියාව + වසා දමන) කියලා ගත්තොත් ගැලපෙනවද? ඔය වගේ අර්ථ ගන්වන්න හොඳ නෑ. කාරියවසම් කියලා කියන්නේ මිනිස්සුන්ට තිබෙන නමක්.

මේක කියන්න හේතුව තථාගතයන් වහන්සේගේ ධර්මය එහෙට මෙහෙට කඩන්න හොඳ නෑ කියන එක කියන්නයි. යමක් තේරෙන්නේ නැත්නම් අර නිග්‍රෝධ ස්වාමීන් වහන්සේ වගේ වෙන්න ඕනෑ. නිග්‍රෝධ ස්වාමීන් වහන්සේට අසෝක අධිරාජයා බණ ටිකක් කියන්න කියනවා. අසෝක අධිරාජයා බණ ටිකක් දේශනා කරන්න කියලා කීවාට පස්සේ ඒ නිග්‍රෝධ ස්වාමීන් වහන්සේ සත් අවුරුදු රහතන් වහන්සේ නමක් හැටියට සිටියත් උන්වහන්සේ ඒ වෙලාවේ ප්‍රකාශ කළේ "මහරජ මම ළඟදී මහණ උනේ, ඒක නිසා මම වැඩිපුර යමක් දන්නේ නෑ. ඒක නිසා මම පාඩම් කරගත්ත පොඩි ගාථාවක් තිබෙනවා ඒක කියන්නම්" කියලා. එහෙම කියලා උන්වහන්සේ '**අප්පමාදො අමතපදං - පමාදො මච්චුනො පදං; අප්පමත්තා න මීයන්ති - යෙ පමත්තා යථා මතා**' කියන ගාථාව දේශනා කළා. ඒ ඥානවන්ත අසෝක රජතුමා ඒකෙන් සෑහීමකට පත් උනා. අසෝක රජතුමා ඒකෙන් සෑහීමකට පත්වෙලා ඒ ස්වාමීන්වහන්සේට ආරාධනා කළා හෙට වඩිනකොට උපාධ්‍යායන් වහන්සේත් එක්ක දානෙට වඩින්න කියලා. ඉතින් ඒ රහතන්වහන්සේලා ඒ විදියයි. ඒක නිසා අපි නිහතමානි ගුණයේ පිහිටන්න ඕනෑ. අපිට හිතෙන හිතෙන දේවල් තථාගතයන් වහන්සේගේ ධර්ම හා හේත්තු කරලා ඒකට ගාවලා කියන්න යන්න හොඳ නෑ, අපිට වරදිනවා. ගොඩක් අයට වැරදිලා තිබෙනවා. මගේ මේ බුදු සසුනේ මහණ වෙච්ච කාලේ ඉඳලාම වැඩ වැරැද්ද ගත්ත ගොඩක් අය මම දැකලා තිබෙනවා.

මේ ධර්මය, ධර්මය හැටියට ඉගෙන ගන්න. ඒක වැරදුනොත් කර්මය හැදෙනවා ඒක පිටිපස්සෙන්. යහපත් බණක් දේශනා කරන වෙලාවේදී කවදාකවත් බාධා කරන්න හොඳ නෑ. යහපත් ධර්මයක් දේශනා කරන වෙලාවේදී කවදාකවත් ඇද කුද කියන්න හොඳ නෑ, ඒකට කියනවා රන්ධගවේසී කියලා. රන්ධගවේසී කෙනාට කවදාකවත් ධර්මය අවබෝධ කරගන්න බෑ. ඒක වෙන්නේ නෑ. හොඳ ධර්මයක් දේහනා කරපු අවස්ථාවකදී තරහක් නිසා හෝ වේවා ඊර්ෂ්‍යාවක් නිසා හෝ වේවා දරාගන්න බැරි කම නිසා හෝ වේවා යම්කිසි කෙනෙක් ඇද කුද කියයිද වරදක් හොයයිද වරදක් මතු කරයිද කවදාකවත් එයාට ධර්මය අවබෝධ වෙන්නේ නෑ කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා.

අපිත් එක්ක මහණ වෙලා හිටියා එක ස්වාමීන්වහන්සේ කෙනෙක්. මට වඩා වැඩිමල්. ඒ හාමුදුරුවෝ පස්සේ කාලෙක තමයි මහණ උනේ. ඉස්සර තරුණ කාලයේදී ටිකක් දඩබ්බර චරිතයක්. මේ හාමුදුරුවෝ පස්සේ කාලයක අපිට කිව්වා ඒක. 'මගේ තිබුණ දඩබ්බර ගතිය නිසා මම ජීවිතේ ගොඩක් පව් කරගත්තා' කියලා. තරුණ කාලයේ ගමක මිනිස්සු එකතු වෙලා හොඳ ස්වාමීන්වහන්සේ නමක් වඩමවාගෙන ඇවිල්ලා, මම හිතන්නේ අරණ්‍යවාසි ස්වාමීන් වහන්සේ නමක් වඩමවාගෙන ඇවිල්ලා ඒ ගමේ විශේෂ ධර්ම දේශනාවක් සිදුකරන්න සූදානම් වෙලා ඉඳලා තිබෙනවා. ගමේ පළාතේ ගොඩක් මිනිස්සු ඇවිල්ලා ඉඳලා තිබෙනවා. මේ හාමුදුරුවෝ ගිහි කාලේ ඒවාට කැමති නෑ. ඒක නිසා ඒ අහල පහළ ගෙදරක තිබුණ බෙරයක් මෙයා කරේ දාගෙන ඇවිල්ලා අර බණ කියන තැන බණ කියන්න දෙන්නෙම නැතුව දිගටම බෙරේ ගගහ ඉඳලා තිබෙනවා. ඒක නිසා හාමුදුරුවොත් ගිහිල්ලා, මිනිස්සුත් ගෙවල් වලට ගිහිල්ලා. පසු කාලීනව කොහොම හරි තමන්ට මහණ වෙන්න සිද්ධ උනා. නමුත් කවදාවත් පොතක් පාඩම කරගන්න අවස්ථාව සැලසුනේ නෑ. ගාථාවක් පාඩම් කරගන්න හිතෙන්නේ නෑ. මම දැක්කා ඒ හාමුදුරුවෝ හිටපු කුටිය. ඒ කුටියේ පුදුම විදියට මදුරුවෝ හිටියා. අනිත් කුටිවලත් මදුරුවෝ ඉන්නවා, කරදරයක් නෑ. නමුත් ඒ කුටියේ මී මැස්සෝ පොදියක් වගේ පුදුම මදුරුවෝ ටිකක්. ඊට පස්සේ ඒ හාමුදුරුවන්ට ආව ඇඟේ කැසිල්ලක්. ඔය සාසනයේ වැඩ කරන්න ගිහිල්ලා වරද්ද ගත්ත වැරදිලි. අත කහන කොට ඒ වෙලාවේම කකුල කහනවා, බෙල්ල කහනවා, පිට කහනවා. කහලා කහලා තුවාල වෙලා. ඔන්න කර්මය එන විදිය. ඇඟ පත හයිය තිබෙනකොට තරුණ කාලය එනකොට ඔය කර්මය ටිකක් යටගිහිල්ලා ගිනි පුපුරු වගේ තිබෙනවා. ශරීරය දූර්වල වෙලා දූර්වල වෙලා යනකොට අළු යට හැංගිලා තිබුණ ගිනි පුපුරු වගේ කර්මය හෙම්හිට හෙම්හිට උඩට එනවා. උඩට ඇවිල්ලා පුච්චනවා. ඉතින් මේ හාමුදුරුවන්ට ඒ කැසිල්ලට බෙහෙත් ගත්තට ඒක හරිගියේ නෑ. පාඩම් කරගන්න බෑ. බණක් කියන්න බෑ. ඔය වගේ බොහෝම බරපතල කර්ම විපාකයක්

විඳලා අවසානයේදී උන්වහන්සේ අපවත් උනා. ඒ හාමුදුරුවෝ ධර්මය දේශනා කරන එක වැළැක්වුවා. ගමක ඉන්න මිනිස්සුන්ට ශ්‍රද්ධාව දියුණු කරගන්න බණක් කියන එක වැළැක්වුවා. ඔය අපේ ජීවිතියේ ඇස් දෙකෙන් දැකපු එකක්.

තව එකක් තිබෙනවා. එක හාමුදුරුවෝ කෙනෙක් හිටියා, ඒ හාමුදුරුවෝ කැමතියි අනිත් හමෝම භාවනා කරනවට. ඒ හාමුදුරුවෝ හරියට මහන්සි ගත්තා අනිත් අය භාවනා කරවන්න. නමුත් බුදුරජාණන් වහන්සේ නියම කරලා තිබෙන, භික්ෂූන් වහන්සේලා මහණ වෙච්ච ගමන්ම ඒ භික්ෂූන් වහන්සේලාට කියලා දෙන්න ධර්ම කාණ්ඩයක්, විනය කොටසක් තිබෙනවා. ඒ කොටස මාතෘකා කොටස ප්‍රාතිමෝක්ෂ දේශනාව සහ ඒකෙ විස්තර අර්ථය ඉගෙන ගන්න ඕනැ. තවත් තිබෙනවා සූත්‍ර ධර්ම කොටසක්. ඔය ටික ඉගෙන ගන්න ඕනැ. ඒක ගුරුවරයෙක් යටතේ ඉගෙන ගන්න ඕනැ. ඉතින් ඒ හාමුදුරුවෝ කැමති නෑ හාමුදුරුවරු පොත් කියවනවට. ඒක නිසා එක අවස්ථාවකදී හරියට දොස් කිව්වා 'මේ ත්‍රිපිටකය තිබෙන නිසා තමයි භාවනා කරන්නේ නැත්තේ, මේවා කියව කියවා ඉන්නවා භාවනාවකට වාඩි වෙන්නේ නෑ, මේ ත්‍රිපිටකය පුච්චන්න ඕනැ' කියලා කිව්වා. ඒ හාමුරුවන්ටත් අවසානයේදී ඇඟේ කැසිල්ලක් හැදිලා මොලේ විකෘති වගේ ස්වභාවයකුත් වෙලා බොහෝම දුක් විඳලා අවසානයේදී ප්‍රසිද්ධ කෙනා අප්‍රසිද්ධියේ මැරිලා ගියා. ඔය මේ බුද්ධ සාසනයේ වැඩ වරද්ද ගත්ත අය. අවසාන කාලයේදී ඒ හාමුදුරුවෝ ඔක්කොගෙන්ම සමාව ගත්තා. කවුරුහරි හාමුදුරුවෝ කෙනෙක් කියලා තිබෙනවා 'ඔබ වහන්සේ වරද්දාගෙන ඉවරයි. අපිට කරන්න දෙයක් නෑ, ඔය යන විදියට යන්න' කියලා. ඒ කියපු දේවල් නිසා ඒ හාමුදුරුවන්ටත් තේරෙන්න ඇති. පස්සේ බුලත් අතවල් හදාගෙන හැම හාමුදුරුවෝ කෙනෙක් ගාවටම ගිහිල්ලා බුලත් අතක් දෙනවා වරදක් උනා නම් සමාවෙන්න කියනවා, අනිත් හාමුදුරුවෝ ගාවට යනවා ඔහොම ඔහොම මම හිතන්නේ සෑහෙන සේනාසන ගණනකට ගියා. ඒ උනත් හරි ගියේ නෑ. ඒ හාමුදුරුවොත් හරිම දුක් විඳලා තමයි ජීවිතිය කෙලවර කළේ.

නිවන් දකින්න කියලා මේ බුද්ධ සාසනයට ආවහම ටික කාලයක් යනකොට පාර පොඩ්ඩක් පෙන්නේ නැතුව යනවා, මොකක් මොකක් හෝ වේවා. ඒක නිසා මේ බුදුගුණ වැඩීම බුදුගුණ මෙනෙහි කිරීම ගිහි අයටත් පැවිදි අයටත් දෙගොල්ලන්ටම හරි පරෙස්සමක්, හරි ආරක්ෂාවක් හරි ගස්සලා දෙනවා. ඒක නිසා තමයි මේ බුදුගුණ භාවනාව වටින්නේ. ඒක නිසා තමයි මේ බුදුගුණ ටික කියලා දෙන්නේ.

ගිහි අයත් ඒ වගේ. සමහර වෙලාවට බටහිර එක එක දේවල් ඉගෙන ගත්තට පස්සේ අමුතු මාන්නයක් එනවා. ඒකෙන් කරන්න බෑ. කොච්චර ඉන්නවද ඉගෙන ගත්ත අය. සමහරු ඒවා දාලා අත්හැරලා එන්නේ ඒකෙ දෙයක් නැති හින්දා. බුදුරජාණන්වහන්සේගේ ගුණ මෙනෙහි කරනකොට අර්ථයක් ඇතුව මෙනෙහි කරන්න ඕනැ. ඒ අර්ථ තමයි දැන් කියලා දුන්නේ.

13) **එකායනමග්ගං ගතොති බුද්ධො** = සිහි නුවණින් යුක්ත වෙච්ච ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ ඒකායන මාර්ගයේ ගමන් කරපු නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

14) **එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො** = තනියමම අනුත්තර වූ සම්මා සම්බෝධියට පත් වෙච්ච නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

15) **අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභා බුද්ධො** = අබුද්ධිය කියන මෝහය නම් වූ නොවැටහෙන ගතිය නැති කරලා වැටහෙන ගතිය ලබා ගත්ත නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

**බුද්ධොති නෙතං නාමං මාතරා කතං** = බුද්ධ කියන මේ නම මව විසින් කරපු නමක් නොවෙයි.

ළමයින්ට නම් දෙනකොට අම්මා තියපු නම තාත්තා තියපු නම කියලා තිබෙනවා. නමුත් එහෙම නමක් නොවෙයි මේක. සාරිපුත්ත කියලා කියන්නේ අම්මගෙන් ආව නමක්. සාරී කියන්නේ බැමිණියගේ පුතා සාරීපුත්ත. මොග්ගලී කියන බැමිණියගේ පුතා මොග්ගල්ලාන.

**න පිතරා කතං** = මේ නම සුද්ධෝදන රජතුමාගෙන් ආපු නමකුත් නොවෙයි. (පියාගෙන් ආපු නමක් නොවෙයි).
**න භාතරා කතං** = ඒ පවුලේ තවත් සහෝදරයෙක් කරපු නමකුත් නොවෙයි.
**න භගිනියා කතං** = මේ නම් සහෝදරියක් විසින් කරපු නමකුත් නොවෙයි.
**න මිත්තාමච්චෙහි කතං** = නෑ දෑ හිත මිත්‍රාදීන් විසින් මැති ඇමති වරුන් විසින් කරපු නමකුත් නොවෙයි.
**න ඤාතිසාලොහිතෙහි කතං** = සහලේ නෑයන් විසින් කරපු එකකුත් නොවෙයි.
**න සමණබ්‍රාහ්මණෙහි කතං** = මේ නම ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් කරපු නමකුත් නොවෙයි.
**න දෙවතාහි කතං** = මේ නම දෙවි දේවතාවෝ දීපු නමකුත් නොවෙයි.
**විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධො''** = බුද්ධ කියන මේ වචනය ලොව්තුරා බුදුරජාණන්වහන්සේ බෝධීන්වහන්සේගේ මූලයේ වැඩ ඉන්නකොට උන්වහන්සේට චතුරාර්ය සත්‍ය ප්‍රතිලාභය සමග ලැබිච්ච ප්‍රඥප්තියක්.

මෙහෙම කියන්න හේතුව තමයි ඔය සමහර අයට පවුලේ කට්ටිය එකතු වෙලා ශ්‍රමණ බ්‍රාහ්මණයෝ එකතු වෙලා නම් දෙනවා. මේ පහු ගිය කාලේ අවුරුදු 20 කට වගේ පෙර සමාන්‍යයෙන් රුපියල් 250 කට විතර විද්‍යා විශාරද, පණ්ඩිත කියලා නමක් ගන්න පුළුවන් කමක් තිබුණා. ඒක දැන් නවත්වලා. ඒක මග විහිළුවකට ලක් උනා. ඒවගේ එක එක ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඒවගේම එක එක මණ්ඩල වලින් මොකක් හරි නමක් දෙනවා.

මේ බුද්ධ කියන වචනය අපි දැනගෙන තිබෙන එක හොඳයි. එතකොට අපිට වරදින්නේ නෑ. තව ගාථාවක් තිබෙනවා. ඒ ගාථාව මේ පින්වතුන් දැනගන්න එක හොඳයි.

**''අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං, භාවෙතබ්බං ච භාවිතං;**
**පහාතබ්බං පහීනං මෙ, තස්මා 'බුද්ධොස්මි' බ්‍රාහ්මණ''.**

**අභිඤ්ඤෙය්‍යං** = විශේෂිත ඥානයකින් අවබෝධ කරගත යුතු ධර්ම වලට කියනවා අභිඤ්ඤෙය්‍ය ධර්ම කියලා.

**අභිඤ්ඤාතං** = ඒ අභිඤ්ඤෙය්‍ය ධර්ම සියල්ලක්ම බුදුරජාණන්වහන්සේ අවබෝධ කර ගත්තා.

**භාවෙතබ්බං ච භාවිතං** = භාවේතබ්බ කියලා කියන්නේ වැඩිය යුතු ධර්ම. සීලය වඩන්න ඕනෑ, සමාධිය වඩන්න ඕනෑ, ප්‍රඥාව වඩන්න ඕනෑ, ශ්‍රද්ධාව වඩා ගන්න ඕනෑ, වීරිය වඩන්න ඕනෑ, සතිය සමාධිය

ප්‍රඥාව වඩන්න ඕනෑ. බොජ්ඣංග ධර්ම වඩන්න ඕනෑ, මාර්ග ධර්ම වඩන්න ඕනෑ. මේ වගේ වැඩිය යුතු සියලුම ධර්ම මම භාවිතා කරන ලදී.

**පහාතබ්බං** = "ප්‍රහීණ කළයුතු අයින් කළ යුතු ඉවත් කළ යුතු දේවල්.
**පහීනං** = ඒ ප්‍රහාණය කලයුතු සියලුම ධර්ම මා තුල ප්‍රහීණ වෙලා තිබෙන්නේ
**තස්මා** = අන්න ඒ නිසා
**'බුද්ධොස්මි' බ්‍රාහ්මණ** = අන්න ඒ නිසා බ්‍රාහ්මණය මම බුද්ධ නම් වෙමි" කියලා කියනවා.

ඔය කියන භවය උද්ද කරපු නිසා බුද්ධ කියලා කියනවා කියන කථා මේ එකක්වත් ඇදිලාවත් නෑ. හොඳ ලස්සනට පැහැදිලිව **බුද්ධ** කියන්නේ මෙහෙමයි කියලා තිබෙද්දී අපේ කථා දාන්න යන්න හොඳ නෑ.

අපි සාමාන්‍යයෙන් රාත්‍රියකට හඳ නැති දවසක අහස දිහා බැලුවහම පැහැපත් අහසේ ගණන් කරන්න බැරි තරම් තරු කැට තිබෙනවා. ඔය අපිට පේන ටික. ඒවගේම ඇමරිකාවට එංගලන්තයට චීනයට හැම පැත්තට පේනවා. මෙහෙම බැලුවහම මේ හැම තැනම තිබෙන තරු කැට ඔක්කොම ග්‍රහ වස්තු. මේකත් ග්‍රහ වස්තුවක්. මෙතැන ඉඳලා ඒ හැම එකකටම යන්න තිබෙන දුර හොයාගෙන නෑ. එයින් හතර පහක් පමණයි තවම හොයාගෙන තිබෙන්නේ. එහෙම දැන ගන්නත් බෑ. නමුත් තථාගතයන් වහන්සේ ඔය තිබෙන්නා වූ දේවල් වල මොනවාද තිබෙන්නේ, ඕවට යන්නේ කොහොමද, ඕවගේ ඉන්නේ කවුද, ළඟ පහත ඉන්නේ කවුද කියලා හැම දෙයක්ම දැනගෙන දැකගෙන අවබෝධ කරගත්තා. මේ ලෝකේ වටේම තිබෙන්නා වූ තරු කැට මේ ග්‍රහ ලෝක ඒවා ආශ්‍රය කරගෙන පේන සත්වයෝ ඉන්නවා නොපෙනන සත්වයෝ ඉන්නවා. මේ අයගේ සැප සම්පත් මෙහෙමයි කියලා කවදාකවත් ඒවාට ලෝභ කිරීමක්, මට ඒවා දැන ගන්නාවූ නුවණක් තිබෙනවා කියලා ඒ නුවණ සම්බන්ධයෙන් අහංකාර කමක් උඩගු කමක් මාන්නයක් නැති පුදුම විදියේ නිරුපක්ලේශ ස්වභාවයක් තථාගතයන් වහන්සේගේ තිබෙන්නේ. තමන් වහන්සේගේ ඥානයේවත් ඇලෙන්නේ නැති ඥානයවත් පතන්නේ නැති ස්වභාවයක් තථාගතයන් වහන්සේට තිබෙන්නේ.

සමහර වෙලාවට කෙනෙක් ඥානවන්තව කථා කරනවා දක්ෂව කථා කරනවා විශාරදව කථා කරනවා දැක්කහම 'මටත් මේ වගේ කථා කරන්න පුළුවන් හැකියාවක් තිබෙනවානම් කොච්චර හොඳයිද' කියලා ඒකෙ ඇලෙනවා. 'මේ වගේ වැටහෙන කමක්, මේ වගේ කථා කිරීමක්, මේ වගේ දක්ෂ උච්චාරණයක් මටත් තිබෙනවා නම් කොච්චර හොඳයිද, මමත් ඕක ටික ටික හරි පුරුදු කරන්න ඕනෑ' කියලා හිතක් පහළ වෙනවා. ඒකට කියනවා කථාවේ ඇලුනා කියලා. බුදුරජාණන් වහන්සේ කවදාකවත්ම කිසි කෙනෙකුගේ කථාවේ ඇලෙන්නේ නෑ. නන්ද ස්වාමීන් වහන්සේ එක වෙලාවක බණ දේශනාවක් කරනවා. නන්ද ස්වාමීන්වහන්සේ බණ දේශනා කරනකොට තථාගතයන් වහන්සේ ගිහිල්ලා බණ අහනවා. ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ හිටගෙන ඉන්නවා දැකලා නන්ද හාමුදුරුවෝ අහනවා "ස්වාමීනි ඔබ වහන්සේ හිටගෙනම හිටියා, කොයි වේලාවේද වැඩම කළේ" කියලා. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා "බණ පටන් ගන්න කොටයි මම ආවේ" කියලා. ඒ තරමට බුදුරජාණන්වහන්සේ අනිත් අය දේශනා කරන ඒවත් අහනවා.

දවසක් සෝන කුටිකණ්ණ කියන ස්වාමීන් වහන්සේ තථාගතයන් වහන්සේ බලන්න වැඩම කළා. එදා බුදුරජාණන් වහන්සේ සෝන කුටිකණ්ණ ස්වාමීන් වහන්සේට දේශනා කරනවා අට්ඨක වග්ගය කියන කොටස සජ්ඣායනා කරන්න කියලා. උන්වහන්සේ ඒක හරිම ලස්සනට ඒක සජ්ඣායනා කළා. බුදුරජාණන්වහන්සේ අහගෙන හිටියා. ඒ වගේ අනිත් අය දේශනා කරන යහපත් බණ බුදුරජාණන් වහන්සේ අහනවා. ඒවගේ ඉතාමත් හොඳ නිරුපක්ලේශී ගතියක්, ඇලෙන්නේ නැති ගතියක්, පතන්නේ නැති ගතියක් ඥානයේවත් ඇලෙන්නේ නැති ගතියක් උන්වහසේට තිබෙනවා.

**පහාතබ්බං පහීනං මෙ** - මාගේ ජීවිතියේ අයින් කළ යුතු දේවල් අයින් කරලා තිබෙන්නේ. පහාතබ්බ කියලා කියන්නේ අයින් කළ යුතු දේ. ඒ තමයි කෙලෙස්. මූලික වශයෙන් අවිද්‍යාව - තණ්හාව - ඊර්ෂ්‍යාව - මාන්නය - දෘෂ්ඨිය යන මේ සියල්ලක්ම අයින් කළ යුතු දේවල්. අයින් කළ යුතු සියල්ලක්ම අයින් කරලා උන්වහන්සේ ප්‍රහීණ කළ යුතු සියල්ල ප්‍රහීණ කරලා තිබෙනවා. ඒ නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

<u>ප්‍රශ්නය</u> - **තස්ස** කියන ඒකෙ තේරුම මොකද්ද?

<u>පිළිතුර</u> - **තස්ස** කිව්වහම 'ඒ' කියලත් ගන්නවා 'උන්වහන්සේට' කියලත් ගන්නවා. 'එයාට' කියලත් ගන්නවා 'එයාගේ' කියලත් ගන්නවා. 'ඔහුට' සහ 'ඔහුගේ' කියලත් ගන්නවා. **තස්ස** කියන වචනයේ අර්ථ කීපයක් තිබෙනවා. ඒ වාක්‍යයේ හැටියටයි ගන්නේ. **තස්ස භගවතෝ** කියලා ගත්තහම **'ඒ භාග්‍යවතුන් වහන්සේට'** නැත්නම් **'ඒ භාග්‍යවතුන් වහන්සේගේ'**. **තස්ස පුරිසස්ස** කියලා කිව්වහම 'ඒ පුරුෂයාගේ' 'ඒ පුරුෂයාට' - **තස්ස ගෙහස්ස** කිව්වහම 'ඒ ගෙදර'- 'ඒ ගෙට' - එහෙමයි තිබෙන්නේ.

අද මේ කියන්නේ බුදුගුණ භාවනාව ගැන. බුදුරජාණන් වහන්සේ සම්මත වශයෙන් රජ පවුලක උපන් කෙනෙක්. උන් වහන්සේ අර රජ සැප අතහැරලා ගියේ තමන් වහන්සේ අවබෝධ කරගත්තු ධර්මය සුද්ධෝදන රජ්ජුරුවන්ටයි යසෝදරා දේවියටයි රාහුල කුමාරයාටයි විතරක් දේශනා කරන්න නොවෙයි. උන්වහන්සේට තිබුණේ හරිම පොදු හැඟීමක්. උන්වහන්සේට තිබුණේ හරිම සාධාරණ කාරුණික භාවයක්. ඒක නිසා උන්වහන්සේට 'මම කවදාහරි කොහොම හරි මේ ධර්මය අවබෝධ කරගන්නවා' කියලා කැප වීම හරියට තිබුණා. උන්වහන්සේගේ ඒ කැප වීම සියලුම සත්වයන් වෙනුවෙනුයි සිද්ධ කළේ.

තවත් කාරණයක් තිබෙනවා, සුද්ධෝදන රජ්ජුරුවෝ සාස්තරයක් අහලා ඒ පැත්තෙන් කරුණු කාරණා ටිකක් අයින් කළා. සුද්ධෝදන රජ්ජුරුවෝ රාජ්‍ය නියෝගයක් දැම්මා ඒ පැත්තෙන් මළ මිනී ගෙනියන්න බෑ කියලා. ලෙඩ්ඩු ඉන්නවා නම් ඒ වෙන පැත්තකින් යන්න කිව්වා. ඒවගේම ඒ කුමාරයට පේන්න මහලු අයට ඉන්න බෑ කියලා නීතියක් දැම්මා. නමුත් බෝධිසත්වයන් යන පාරේ ඒ අය හිටියා. මළ මිනියකුත් දැක්කා. මහල්ලෙකුත් දැක්කා. ලෙඩ්ඩු තියන්න එපා කිව්වට ලෙඩෙකුත් දැක්කා. පැවිදි රූපයකුත් දැක්කා. ඇත්ත වශයෙන්ම දෙවි දේවතාවෝ තමයි ඒ විදියට පෙනී ඉඳල ඒ වැඩේ කළේ. නැත්නම් ඒ පැත්ත පළාතේ කවුරුවත් හිටියේ නෑ. ඒක නිසා එහෙම ඒවත් තිබෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එක සූත්‍රයක තිබෙනවා සුද්ධෝදන රජ්ජුරුවන්ටත් යසෝධරා දේවියටත් කියලයි ගියේ කියලා.

<u>පිළිතුර</u> - සිදුහත් කුමාරයා කඩදා හරි යන කථාව දන්නවා. ඒක නිසා තමයි ඔය ගේට්ටු වහල දැම්මේ. එදා සිදුහත් කුමාරයා යනකොට යසෝධරා දේවිය බලලා අහක් වෙලා ගියා. කියලා තිබෙන්නේ දෙවි දේවතාවෝ දොරවල් ඇරියා කියලා. ඒ සූත්‍රයක අඩා වැලපුනා කියලා තිබෙන්නේ යන වෙලාවේ නොවෙයි. ස්වභාවයෙන්ම සිදුහත් කුමාරයා යයි කියන අදහස තිබුණා. සුද්ධෝදන රජ්ජුරුවන්ට කලින්ම කියලා තිබුණා සිදුහත් කුමාරය ගිහි ගෙයින් යනවා කියලා. ඒක නිසා සෝකයක් තිබුණා. ඒක නිසයි security දැම්මේ. නමුත් යන වෙලාවට කියලා ගියේ නෑ.

මේ වගේ අපි බුදුරජාණන් වහන්සේගේ ගුණ මෙනෙහි කරන්න ඕනෑ. උන්වහන්සේ සියලුම දේවල් අත්හැරලා දාලා වැඩම කළේ පොදු **කරුණාව** දයාව නිසයි.

මේ කරුණාව කියන චෛතසිකයේ ආනුභාවය ගැන බලනකොට මේ කරුණා චෛතසිකය අපේ හිත්වල වැඩ කරන්නේ සීමාන්විතවයි. සමහර අයට කරුණාව තිබෙනවා. නමුත් සමහර විට තුන්දෙනකුටයි. සමහර අයට කරුණාව 5 දෙනෙකුටයි. සමහර අයට කරුණාව එක්කෙනෙකුටයි. ඒ කියන්නේ ඒක පිරිසිදු කරුණාව නොවෙයි. ටිකක් අපිරිසිදු කරුණාවක් තිබෙන්නේ. තමන්ගේ පවුලේ ඉන්නා වූ දරුවෝ දෙන්නා ස්වාමියා භාර්යාව අම්මා තාත්තා යන අයට පමණක් කරුණාව තිබෙනවා. අල්ලපු ගෙදර අම්මට තාත්තට දරුවන්ට කරුණාවක් නෑ. සමහර අයට මිනිස්සුන්ට කරුණාව නෑ, බල්ලන්ට බළලුන්ට කරුණාව තිබෙනවා. ඒක නිසා මේ මිනිස්සුන්ගේ තිබෙන කරුණාව සීමාන්විතයි. බොහෝම පොඩ්ඩයි. ඒ තිබෙන පොඩ්ඩත් ලෝභයෙන් මිශ්‍රවෙලා. කරුණාව හැටියට සමහර විට වැඩ කරන්නේ ආලය - ලෝභය - රාගය වැනි දේවල් මිශ්‍ර වෙලා. සමහර අයට කරුණාව තිබෙනවා පළාතටම. මහා බ්‍රහ්මයාගේ කරුණාව ඊට ටිකක් වැඩිපුර තිබෙනවා.

නමුත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ කරුණාව එහෙම නොවෙයි. ඒක අමුතුම දෙයක්. ඒ කරුණාවේ අමුතුම විදියේ ස්වභාවයක් තිබෙන්නේ. ඒක නිසා උන්වහන්සේගේ සිතේ පහළ වෙන කරුණා චෛතසිකය මහා පුදුමයි. තමන් වහන්සේට නින්දා අපහාස ගර්ජන තර්ජන පොදි බැඳගෙන එත්දීත් උන්වහන්සේට හිතෙනවා මේ අය මේ දුකෙන් නිදහස් කරන්න ඕනෑ කියලා. හිතෙන්නේ නැත්ද ඒක අමුතුයි කියලා? තමන්ට බණිනවා දොස් කියනවා නින්දා අපහාස කරනවා, එහෙම කරත්දීත් උන්වහන්සේට හිතෙනවා 'මේ සත්වයා මේ මනුස්සයා සසරින් මුදවන්න ඕනෑ, මෙයාට වේදනාවක් ඇතිවෙනවා - මෙයාට චිත්ත පීඩා ඇතිවෙනවා - මෙයාට ලෙඩ දුක් ඇතිවෙනවා - මේ ලෙඩ දුක් හැදෙන ඇඟ මෙයාට අයින් කරලා දෙන්න ඕනෑ - මේ ලෙඩ දුක් හැදෙනා වූ ශරීරය මෙයාගෙන් ඉවත් කරලා දාන්න ඕනෑ - මෙයා විඳවන්නේ මේ වේදනාව නිසයි - මේ වේදනාව නැතිකරලා දෙන්න ඕනෑ - මෙයා මේ එක එක දේවල් දැන හඳුනා ගන්නේ සංඥාව නිසයි - ඒක නිසා මේ සංඥාව අයින් කරලා දෙන්න ඕනෑ - මේ එක එක භයානක දේවල් දැනගන්නේ හිත නිසයි - ඒක නිසා මේ හිත අයින් කරලා දෙන්න ඕනෑ - මෙයාට මේ චේතනාව තිබෙන නිසා තමයි දිගට යන දුක්වලට පත්වෙන කරුණු හදන්නේ - ඒකනිසා මේ චේතනාව අක්‍රිය කරලා දෙන්න ඕනෑ නැත්නම් මෙයා නැවත නැවත රූප හදමින් ඒවාට ඇලී බැඳී මෙයා දුක් විඳ විඳ යනවා කියලා' බුදුරජාණන්වහන්සේට හිතෙනවා. ඒකෙ හරි අමුතු ගතියක් තිබෙනවා. අනිත් අයට හිතෙන්නේ නැති අනිත් අයට දැනෙන්නේ නැති අනිත් අය සලකන්නේ නැති සානුකම්පිත ගතියක් කරුණා ගතියක් උන්වහන්සේට තිබෙනවා. ඒක හරි ප්‍රබලයි.

මම දැක්කා වීඩියෝ එක්ක පැටව් දාපු බැල්ලියක් මනුස්සයෙක් ගාවට ගිහිල්ලා බුරනවා වටේ යනවා මූණ දිහා බලනවා. ඉතින් ඒ මනුස්සයා ඒ බැල්ලි යන පාර දිගේ යනවා. ගියාට පස්සේ පස් කන්දක් කඩා වැටිලා ඒක අස්සට බලුපැටව් වැටිලා, එයාට ගන්න බෑ. ඒක තමයි අර ඇවිල්ලා කියන්නේ. ඊට පස්සේ ඒ මනුස්සයාට තේරෙනවා පැටව් ඒකෙ අස්සේ ඉන්නවා කියලා. ඉතින් ඒ මනුස්සයා පැටව් ඉන්න තැන පස් අයින් කරනවා. ඒ බැල්ලිත් එතැනට බැහැලා අතින් පස් හූරනවා පැටව් ගන්න. බලන්න මේ බැල්ලි කියන සත්වයා තමන්ගේ වර්ගයේ ඉන්න මේ පොඩි සතාට කරන්න කියන්න දෙයක් නෑ, මම මේකට උදව් කරන්න ඕනෑ කියලා තමයි අර මනුස්සයට ගිහිල්ලා කිව්වේ එයාගේ භාෂාවෙන්. ඒ මනුස්සයා එහෙම භාරනකොට එයත් ගිහිල්ලා උදව්වක් කරනවා. පැටව් ටික කොහොම හරි එළියට ගත්තා. ඒක බල්ලාගේ සිතේ පහළ වෙන කාරුණික චේතනාවක්. ඒක අකුසලයක් නොවෙයි. අනිත් එක්කෙනා දුකට පත් උනාට පස්සේ 'එයා බේර ගන්න ඕනෑ' කියන හැඟීම් මාත්‍රයට තමයි කියන්නේ කරුණාව කියලා.

මම තව තැනක දැක්කා බල්ලෙක් වාහනේකට හැප්පිලා පාරේ වැටිලා ඉන්නවා. තව බලල්ලෙක් ගිහිල්ලා එයාව ඇදගෙන එනවා පාර අයිනට තවත් වාහනේක හැප්පෙයි කියලා. තව බල්ලෙක් හිටියා එයා ඒ ළඟින් ඔලුව තියාගෙන ඉන්නවා. එයා තනිවෙයි කියලා. අනිත් කෙනෙක් දුකට පත් උනහම අනිත් කෙනාට විපතක් ඇති උනහම ඒ විපත ගැන තමන්ට සතුටු වෙන්න බැරුව 'කොහොමද මම

මෙයාට පිහිට වෙන්නේ' කියන අදහසක් එනවා. අන්න ඒ අදහස් මාත්‍රයට කියනවා **කරුණාව** කියලා. දැන් ඕක සත්තුන්ටත් තිබෙනවා, මනුස්සයන්ටත් තිබෙනවා, දෙවියන්ටත් තිබෙනවා, බුදුරජාණන් වහන්සේටත් තිබෙනවා. බුදුරජාණන් වහන්සේ ඔය කියන්නා වූ ධර්ම ස්වභාවය තමයි පාවිච්චි කළේ පාරමී පුරන්න. ඕක නැත්නම් පාරමී පුරන්න බෑ. සත්වයන් කෙරෙහි කරුණාව දැනෙන්නේ නැතුව වැඩක් කරන්න බෑ.

දැන් ඔය දරුවෝ ළමයි ලපටි අත්හැරලා දාලා දෙමව්පියෝ රට යනවා. ඒ යන්නේ ළමයින්ට කන්න බොන්න හොයලා දෙන්න. ඒ දෙමව්පියන් ගිහිල්ලා නන්නාඳුරන රටක නෑදෑයෙක් අම්මෙක් අප්පෙක් නැති රටකට ගිහිල්ලා මහන්සි වෙන්නේ ඔක්කොම කරන්නේ ළමයි කෙරෙහි තිබෙන කරුණා හැඟීම නිසා. ඇත්තටම හිතලා බලන්න මොකක්ද මේකේ තිබෙන ආශ්චර්ය කියලා. ඒ කරුණාව කියන ධර්මය හරිම අමුතු දෙයක්. ඒකනිසා බුදුරජාණන්වහන්සේගේ පාරමී භූමියේදී පාද තලය තමයි කරුණාව. බුදුරජාණන්වහන්සේ කරුණාව මුල් කරගෙන තමයි ගුණ පුරන්නේ. කරුණාව මුල් කරගෙන තමයි පාරමී පුරන්නේ. කරුණාව නැති එක්කෙනාට ඒක කරන්න බෑ. ඒක නිසා කියනවා කරුණාව තමයි බුදුරජාණන් වහන්සේගේ පාද තලය **ප්‍රඥාව** තමයි **සිරස්තලය** කියලා.

දෙමව්පියන්ටත් තිබෙනවා කරුණාව. ඒ දෙමව්පියන්ට තිබෙන කරුණාව තිබෙන්නේ එක්කෙනෙකුට දෙන්නෙකුට විතරයි. ඒ තමන්ගේ කමින් බැඳීගිය අයට විතරයි කරුණාව තිබෙන්නේ. කරුණාව කියලා කියන්නේ **පරදුක්ඛෙ හදය කම්පතීති කරුණා** = අනුන්ගේ දුකේදී කම්පා වෙන ගතිය තමයි කරුණාව කියලා කියන්නේ. බුදුරජාණන්වහන්සේගේ මහා කරුණාව කියලා කියන්නේ, බුදුරජාණන්වහන්සේ නොසලකා හරින්නේ නෑ එක තැනක්වත්. අපායගාමී සත්වයන් බේරා ගන්නවා. සමහර වෙලාවට ඒ අය යන්න යන track එක වෙනස් කරලා දානවා.

අම්මා කෙනෙකුගේ කරුණාව තත්තා කෙනෙකුගේ කරුණාව තිරිසන් සත්වයන්ගේ කරුණාව දිහා බැලුවහම මේ කරුණාව කියන චෛතසිකය කොච්චර ආශ්චර්යමත් දෙයක් කරනවාද, ඒ කෙනාව මෙහෙයවනවාද කියලා හිතලා බලන්න. බෝධිසත්වයක් වහන්සේ ජීවිතය කැප කරලා අනිත් එක්කෙනාව බේර ගන්නවා. ඒක තමයි ඒ කරුණාවේ තිබෙන උතුම්කම. නමුත් නමක් ගමක් උන්වහසේ අපේක්ෂා කරන්නේ නෑ.

තව එකක් තමයි කරුණාවේ ස්වරූපයෙන් කිර්තිය ලබන්න එනවා. මම කරුණාව දක්වනවා කෙනෙකුට කවුරුහරි අතේ කැමරාවක් තිබෙනවා නම්. නමුත් ඒක කරුණාව නොවෙයි. ඒක ෆොටෝ එකක් ගස්සා ගැනීමේ තණ්හාව. සමහර වෙලාවට කට්ටිය ගිහිල්ලා පාර්සල් බෙදනවා ටීවී වලට දාන්න. ඒක ඇත්තටම කරුණාවම නොවෙයි. ඒක කරුණාවේ ස්වරූපය ගත්ත කීර්තියට ප්‍රශංසාවට තිබෙන ලෝභය ඒ තිබෙන්නේ. කරුණාව කියන එක ඔහොම නොවෙයි. මේ ටික කියන්නේ ඇත්තටම කරුණාව යනු කුමක්දැයි කියලා තේරුම් ගන්න. දැන් අර බැල්ලක් ගිහිල්ලා පැටව් ඉන්න තැන හැරුවේ කැමරාවක් තිබෙන නිසා නොවෙයි. කවුරුහරි මනුස්සයෙක් ඒක කැමරාවට අරගෙන තිබෙනවා. නමුත් ඒ සතා ඒක කළේ අව්‍යාජ හැඟීමකින්. මේවා දැන ගත්තොත් තමයි අපිට පුළුවන් කම තිබෙන්නේ නියම කරුණාවක් හදාගන්නත් බුදුරජාණන්වහන්සේගේ තිබෙන ගුණය දැනගන්නත්.

බුදුරජාණන් වහන්සේ කරුණාවේ ස්වරූපය - මෛත්‍රියේ ස්වරූපය - මුදිතාවේ ස්වරූපය හොඳට පැහැදිලි කළේ අපේ සුභ සිද්ධිය සඳහා. උන්වහන්සේගේ ගමන් මාර්ගයේ අපි යන්න ඕනෑ ඕවා දැනගෙනයි. කරුණාව වැඩෙන්න වැඩෙන්න අපේ හිත සෞම්‍ය කරනවා මෘදු කරනවා. හරිම මුදු මොලොක් කරලා අපේ කුසල ධර්මයන් වඩනවා. කරුණාව පරාර්ථකාමීයි.

හොඳයි  සැමදෙනාටම තෙරුවන් සරණයි! ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.
***